ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2014 ඔක්තෝබර් මස 17 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය - 2014 ඔක්තෝබර්

අඩු උද්ධමන පරිසරය අඛණ්ඩව හැට අට වැනි මාසයටත් පවත්වා ගනිමින්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මනිනු ලබන මතුපිට උද්ධමනය 2014 සැප්තැම්බර් මාසය තුළ දී සියයට 3.5 ක් ලෙස නොවෙනස්ව පැවති අතර, වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන මතුපිට උද්ධමනය පෙර මාසයේ පැවති සියයට 4.5 සිට සියයට 4.2 ක් දක්වා අඩු විය. ඒ අතර වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මනිනු ලබන මූලික උද්ධමනය, 2014 අගෝස්තු මාසයේ පැවති සියයට 3.9 සිට 2014 සැප්තැම්බර් මාසයේ දී සියයට 3.7 ක් දක්වා අඩු විය. ජාත්‍යන්තර බලශක්ති මිල ගණන් සැලකිය යුතු ලෙස පහළ යෑම සහ දේශීය විදුලිබල යටිතල පහසුකම් වැඩිදියුණු වීම හේතුවෙන් බලශක්ති මිල ගණන් අඩු කිරීම සඳහා රජයට හැකියාව ලැබුණු අතර, මෙම මිල සංශෝධනවල යහපත් බලපෑම උද්ධමනය තුළින් පිළිබිඹු වෙමින් පවතී. මේ හේතුවෙන් සහ ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ප්‍රධාන පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් අඛණ්ඩව අඩු වීම මගින්, උද්ධමනය වසර අවසානය වනවිට පෙර පුරෝකථනය කරන ලද සියයට 4 - 5 ක් වූ පරාසයටත් වඩා පහළ අගයක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2014 සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරන ලද මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර වශයෙන් දේශීය මුදල් වෙළෙඳපොළ තුළ දක්නට ලැබුණු උච්චාවචන ක්‍රමයෙන් සමනය වී කෙටිකාලීන මුදල් වෙළෙඳපොළ පොලී අනුපාතික පුළුල් වශයෙන් ස්ථාවර වූ අතර, දිගුකාලීන ණය පොලී අනුපාතික ද අපේක්ෂිත පරිදි පහළ යමින් පවතී. වාණිජ බැංකු විසින් සපයනු ලබන ණය වර්ධනයෙහි මෑතකාලීන ප්‍රවණතාව වෙනස් කරමින් 2014 අගෝස්තු මාසය තුළ වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය රුපියල් බිලියන 47.7 කින් ඉහළ ගියේය. ආර්ථික ක්‍රියාකාරිත්වයේ අඛණ්ඩ වර්ධනය හා සාපේක්ෂව අඩු වෙළෙඳපොළ පොලී අනුපාතික හේතුවෙන්

වාණිජ බැංකු මගින් පෞද්ගලික අංශයට ලබා දෙන ණය අඛණ්ඩව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. බොහෝ වෙළෙඳපොළ නාමික පොලී අනුපාතික මෙතෙක් පැවති පහළම අගයන්හි පැවතුණ ද, අඩු උද්ධමන පරිසරය තුළ මෙම අනුපාතික තවදුරටත් පහළ යෑමේ හැකියාව පවතී. මේ අතර, වසරේ පළමු මාස අට තුළ දී බැංකු පද්ධතිය මගින් රජයට ලබා දුන් ශුද්ධ ණය, 2014 වසර සඳහා රජයේ අයවැය තුළින් අපේක්ෂිත රුපියල් බිලියන 100 හා සාපේක්ෂව රුපියල් බිලියන 60.9 කින් ඉහළ ගිය අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය සංස්ථාවලට ලබා දුන් ණය රුපියල් බිලියන 27.2 කින් අඩු විය. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විදේශ විනිමය ලැබීම් ඉහළ යෑම නිරූපණය කරමින්, වසරේ පළමු මාස අට  තුළ දී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශ වත්කම් රුපියල් බිලියන 289 කින් ඉහළ ගියේය. ඒ අනුව, ජූලි මාසයේ දී සියයට 11.9 දක්වා අඩු වූ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පුළුල් මුදල් ($M_{2b}$) වර්ධනය, 2014 අගෝස්තු මාසයේ දී සියයට 12.3 දක්වා වර්ධනය විය.

වසරේ මේ දක්වා කාලය තුළ දී, එ.ජ. ඩොලරයට එරෙහිව රුපියල සියයට 0.14 කින් අධිප්‍රමාණය වූ අතර, 2014 ඔක්තෝබර් 13 වැනි දින වන විට ඇස්තමේන්තුගත දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 8.7 ක් විය.  මෙම ශක්තිමත් විදේශ සංචිත තත්ත්වය, භාණ්ඩ හා සේවා අපනයනයෙන් ලද අඛණ්ඩ විදේශ විනිමය ලැබීම්, සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සහ රජයට හා පෞද්ගලික අංශයට ලැබුණු අනෙකුත් ලැබීම්වල ප්‍රතිඵලයකි.

මෙම පසුබිම තුළ, 2014 ඔක්තෝබර් 16 වැනි දින පවත්වන ලද මුදල් මණ්ඩල රැස්වීමේ දී දැනට පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය යෝග්‍ය බව තීරණය විය. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙළින්, දැනට පවතින සියයට 6.50 සහ සියයට 8.00 මට්ටමේ නොවෙනස්ව පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය තීරණය කළේය. නැවත දැනුම් දෙන තුරු, විවට වෙළෙඳපොළ කටයුතු සඳහා සහභාගිවන්නන්ගේ නිත්‍ය තැන්පතු පහසුකම් සඳහා වන ප්‍රවේශය තවදුරටත් සීමා වන අතර, මසකට අවස්ථා තුන ඉක්මවා නිත්‍ය තැන්පතු පහසුකම භාවිතා කිරීමේ දී සියයට 5.00 ක අඩු පොලී අනුපාතිකයක් අදාළ වේ. මේ අතර, විවට වෙළෙඳපොළ වෙන්දේසි අවශ්‍ය විට පැවැත්වෙනු ඇත.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථා කාලයේ දී ප්‍රකාශයට පත්කරනු ලැබේ.

| මුදල් ප්‍රතිපත්ති තීරණය : | ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවතී. |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | සියයට 6.50 |
| නිත්‍ය ණය  පහසුකම් අනුපාතිකය (SLFR) | සියයට 8.00 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 6.00 |